# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1967/58 - 2016 මැයි මස 20 වැනි සිකුරාදා - 2016.05.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/15/45/2009

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

අංක 1958/9 දරන හා 2016.03.16 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් වැලිවේරිය, ඇටිකෙහෙල්ගල්ල, අංක 77/1 හි පදිංචි එම්. එච්. ජයරත්න මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 500 හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 3370 දරන හා 2016.02.10 වැනි දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් එම්. එච්. ජයරත්න මහතා වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 3370 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2017.03.15 වැනි දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 මැයි මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය
"අ" ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

*1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත*

*බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම*

එම්. එච්. ජයරත්න,
අංක : 77/1,
ඇටිකෙහෙල්ගල්ල,
වැලිවේරිය,
2016.04.26

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2016.03.16 වැනි දිනැති අංක 1958/9 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ද ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එම්. එච්. ජයරත්න බැඳී සිටින්නාවූ ද 2016.02.10 වැනි දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන.

*පිටපත :* (අනෙක් පාර්ශ්වය)
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංකː500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

1. ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතු ය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න).

2. දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග ද, වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතු ය.

06 - 166

1 A – G 23498 — 19 (2016/05)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*